00019

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**පෙර පාසල් උසස් අධ්‍යාපන සහතික පත්‍ර වැඩසටහන - 2015**

**අවසාන පරීක්ෂණය - 2015**

**පූර්ව ළමාවියේ කෙළි සෙල්ලම් – ESC2219**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 දෙසැම්බර් මස 05 වන දින** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**1 වන කොටස**

01. ‘සෙල්ලම’ යන පදය නිර්වචනය කරන්න.

02. සෙල්ලම්වල ලක්ෂණ දෙකක් (02) ලියන්න.

03. ශක්තිජනක ක්‍රීඩා සඳහා උදාහරණයක් ලියන්න.

04. පහත දැක්වෙන එක් එක් සෙල්ලම් වර්ගයේ ලක්ෂණ දෙකක් (02) බැගින් පැහැදිලි කරන්න.

    i. අනුකරණ සෙල්ලම්
    ii. දක්ෂතා/කුසලතා සෙල්ලම්

05. සෙල්ලම් ක්‍රියාකාරකම් මගින් පෙරපාසල් දරුවන් තුළ සංවර්ධනය කළ හැකි කුසලතා තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

06. “ගවේෂණාත්මක අවධිය” යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

07. වයස මාස 12 ක් වූ ළමයකු සෙල්ලම් කිරීමේදී ප්‍රදර්ශනය කරන චර්යාමය ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

08. ‘ළමා කාලයේ සාරය වන්නේ සෙල්ලමයි.” මෙම කියමන සනාථ කිරීම සඳහා කරුණු දෙකක් (02) ක් ලියන්න.

(ලකුණු 8 x 5 = 40)

## 2 වන කොටස

09. (i) කුඩා ළමුන් සෙල්ලම් සඳහා යෙදවීමේ අරමුණු දෙකක් (02) පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) "සෙල්ලමක් යනු සිතෙහි මැවෙන පරිකල්පන සහ චිත්තරූප අයත් මානසික ක්‍රියාවලියකි."

ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න.

(ලකුණු 12)

10. (i) සෙල්ලම් වර්ග නම් කරන්න. (ලකුණු 08)

(ii) ඔබ ඉහත දක්වන ලද සෙල්ලම් වර්ගවලින් එකක් (01) තෝරාගෙන කුඩා දරුවන් එහි යොදවන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (i) පහත දැක්වෙන එක් එක් ද්‍රව්‍ය භාවිත කරමින් ඉන්ද්‍රිය චාලක සෙල්ලම් තුළින් සංවර්ධනය කළහැකි සංකල්ප/කුසලතා පැහැදිලි කරන්න.

අ- විවිධ ජ්‍යාමිතික හැඩතල

ආ- සෞන්දර්යාත්මක මෝස්තර කට්ටල (ලකුණු 10)

(ii) එම ද්‍රව්‍ය අතරින් ඕනෑම එකක් (01) තෝරාගෙන ඔබ ඉහත සඳහන් කළ දක්ෂතා/සංකල්ප වයස අවුරුදු 3-5 අතර ළමයින් තුළ සංවර්ධනය කිරීම සඳහා සෙල්ලම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන්න.

(ලකුණු 10)

12. "මූලික භාෂා කුසලතා ආශ්‍රිත සෙල්ලම් ක්‍රියාකාරකමක් මගින් ළමයින්ගේ නිර්මාපි බව සංවර්ධනය කළ හැකිය."

i. බාලවියේ ළමයින් තුළ පරිකල්පනය හා නිර්මාපි චින්තනය සංවර්ධනය කිරීම සඳහා ඔබ සෙල්ලම් ක්‍රියාකාරකම් දෙකක් සංවිධානය කරන අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. ඔබ ඉහත පැහැදිලි කළ ක්‍රියාකාරකම්වල ළමයින් යෙදවීමේදී ගුරු භූමිකාවේ ඇති වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 08)

13. (i) සෙල්ලම් ක්‍රියාකාරකම්වලදී ගුරුවරයෙකුට ලබාදිය හැකි සෘජු මග පෙන්වීමේ ක්‍රම මොනවාද?

(ලකුණු 10)

(ii) ඔබ ඉහත සඳහන් කළ ක්‍රම අතරින් එකක් (01) තෝරාගෙන සෙල්ලම් ක්‍රියාකාරකමක යෙදී සිටින ළමයින් සඳහා සෘජු මගපෙන්වීම් ලබාදෙන ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**FINAL EXAMINATION - 2015**

**ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME**

**ESC2219- PLAY IN EARLY CHILDHOOD**

**DURATION – THREE (03) HOURS.**

---

Date: 05th December 2015 Time: 1.30 p.m. – 4.30p.m.

---

Answer all questions in **Part I** and three (03) questions from **Part II**.

## PART I

01. Define the term "play"

02. Write **two (02)** characteristics of play.

03. Write an example for "Energetic play"

04. Explain **two (02)** characteristics of each of the following types of play.
    a. pretend play
    b. skillful play

05. Explain in brief **three (03)** skills that can be developed in pre-school children through play activities.

06. What is meant by "Exploratory stage".

07. Describe in brief the behavioural characteristics demonstrated by a 12 months old child in play.

08. "Play is the essence of childhood. Write **two (02)** reasons to support this statement.

(8 x 5 = 40 marks)

## PART II

09. i. Explain **two (02)** aims of engaging young children in play.

(08 marks)

ii. "Play is a psychological process involving imagination and fantasy". Do you agree with this statement. Give reasons for your answer.

(12 marks)

10. i. Name the types of play.

(08 marks)

ii. Select any one of the types you mentioned above and explain citing examples how you would engage children in the type of play you selected.

(12 marks)

11. i. Explain the concepts/skills that can be developed through sensory motor play using each of the following materials.

a. various geometrical shapes.
b. Aesthetic design sets.

(08 marks)

ii. Selecting one (01) of those materials and organize a play activity for children aged 3 – 5 years to develop the concepts/skills you mentioned above.

(12 marks)

12. i. "Children's creativity can be developed through play activities related to basic language skills" Explain how you would organize two play activities to develop imagination and creative thinking in young children.

(12 marks)

ii. Describe the importance of teacher's role in engaging children in the activities you explained above.

(08 marks)

13. i. What are the forms of direct guidance that can be provided by teachers in play activities?

(10 marks)

ii. Select any one (01) of the forms you mentioned above and describe citing examples how you would provide direct guidance for young children engaged in a play activity.

(10 marks)

*-Copyrights reserved -*